සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - I,II

කාලයඃ පැය 03 යි.

නම / විභාග අංකය ................................ අමතර කියවීම් කාලය මි : 10 කි.

සැලකිය යුතුයි. **සිංහල භාෂාව හා සාහිත්‍යය - I**

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.
- I පත්‍රයේ 1 , 2 ප්‍රශ්නවලටත්, II පත්‍රයේ පළමුවන ප්‍රශ්නයටත් 2 , 3 , 4 , 5 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

**I කොටස**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) (1) සිට (5) තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරෙන් අසා ඇති (අ) , (ආ) ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(1) ''සැබැව, දේවයන් වහන්ස, අධර්මකාරී කෙනෙක් නැත. වංශ පරිපාලනය කරන්ට නිසි දරු කෙනෙක් නැත්තාහ.''

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

..........................................................................................................................

(ආ) මෙහි දේවයන් වහන්ස යනුවෙන් හැඳින්වූයේ කවුරුන් ද?

..........................................................................................................................

(2) ''මහණ තා ශාසනයේ උකටලී වූයේ දැ''?

(අ) මෙසේ ශාසනයේ උකටලී වීමට හේතුව කුමක් ද?

..........................................................................................................................

(ආ) මෙම පාඨය ඇතුළත් මුල් කෘතිය ලියැවුණු සාහිත්‍ය අවධිය කුමක් ද?

..........................................................................................................................

(3) ''හා, හා, ඕක නං හොඳ සෙල්ලමක් නෙමෙයි''

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

..........................................................................................................................

(ආ) මෙම සෙල්ලමට සහභාගී වූවන් කවුරුන් ද?

..........................................................................................................................

(4) සඳුන් කපුරු සමගින් පිනි දිය නොමඳ
සොඳින් **කලල්** කරමින් සුවඳ මුව මඳ
නිතින් **හිමඹ** ඉස ඉස ලුහුනු වැව්ව ද
තමන් ගුණය නො හරින වැනි දුදන හඳ

(අ) මෙහි තෙවන පද්‍ය පාදයෙහි අදහස ලියන්න.

..............................................................................................................................................................

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

..............................................................................................................................................................

(5) පැනැ - නැඟී අහසේ පැතිරී ගොසින්
මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්
කුඹුරු - වැව් - පොකුණ **මඹුරවා** දියෙන්
ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්

(අ) කවියේ සඳහන් පරිදි ලොවට ලැබෙන දේ මොනවා ද?

..............................................................................................................................................................

(ආ) මෙම කවිය ඇතුළත් පද්‍ය නිර්මාණය උපුටාගත් කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?

..............................................................................................................................................................

(ලකුණු 4×5=20යි)

(02) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් උත්තර සපයන්න

එකල කුස රජ්ජුරුවෝ ප්‍රභාවතීන්ගේ බස් අසා ''ඉදින් සබඳ, තෙපි ම වේද දන්නා ඒ මට ඇයි දැයි කීම් නම් මුන්ගේ ළය පැලී යන්නේ ය. එහෙයින් මුන් අස්වසා කියමි''යි සිතා ''ප්‍රභාවතිනි, තොප මෙලෙස යාඥා වෙමින් සිටිය දී කුමක් නිසා තොප කීවා නො කෙරෙම් ද තොප කෙරෙහි මාගේ මඳකුත් කෝපයක් කනස්සල්ලෙක් නැත්තේ ය, තව ද කලණ ගුණයන් ඇති රාජපුත්‍රිය, සත්‍ය වචනයක් ඇති කියමි. මේ එක මදු රජ කුලය තබා මෙබඳු නොයෙක් සිය ගණන් රාජ කුලයන් මර්දනය කොට මා කැමති පරිද්දෙන් තොප ඇරගෙන යන්ට සමර්ථ වූවත් මම තොප නිසා මාගේ එබඳු රාජ්‍ය ශ්‍රීය හැර හීන ක්‍රියා කෙරෙමින් මෙතෙක් දවස් මුළුල්ලෙහි දුක් වින්දෙමි. එබඳු වූ මා පෙනී සිටිය දී තොපට කිසියම් භයකුත් නැත්තේ ය'' යි යනාදීන් ප්‍රභාවතීන් අස්වසා සියලු රජ පිරිවරින් පිරිවරන ලදුව ක්ෂත්‍රියමාන උපදවාගෙන මා ජීවත්ව සිටිය දී මාගේ භාර්යාව අනිකෙකු ඇර ගෙන යෙතැ' යි කේශර සිංහරාජයකු මෙන් පැළඹෙමින් ''මේ සියලු සාගල නුවර වාසීහු මා මෙතනට ආ බව දනිත්ව'' යි ඇත මැත පනිමින් අත්පොළසන් දෙමින් ''දැන් දැන් ඒ කොල්ලන් ජීවග්‍රහයෙන් අල්වාගෙන එමි'' සියලු අන්තඃපුර වාසීන් අස්වසා තව ද මණි කනක රජතාදී විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් විරාජමාන වූ රථ යානාවෙක්හි හික්මුණා වූ කීකරු සියලු අශ්වාලංකාරයෙන් සරහන ලද අශ්වයන් යොදව දැන් දැන් ශත්‍රු මථනය කරන්නා වූ මාගේ බල පරාක්‍රම සාමාර්ථ්‍යය බලව'' යනාදීන් අභීත නාද පවත්වමින් ''ශත්‍රු මථනය කිරීම මට භාරය. තෙපි තොපගේ මාළිගාවට ගොස් ඉස් සෝධා නහා සැරහීගන වැද හිඳුවයි ප්‍රභාවතීන් එතනින් නික්මවූහ.

(1) මෙම උද්ධෘතයෙන් ඉස්මතුවන කුස රජුගේ චරිත ලක්ෂණ දෙකක් ලියන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

(ලකුණු 04යි)

(2) කුස ජාතක කතුවරයා අනුගමනය කරන ලද භාෂාවේ විවිධත්වයට නිදසුන් දෙකක් මේ පාඨය ඇසුරින් ලියන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

(ලකුණු 04යි)

(3) කුස රජු තුළ තිබූ මානුෂික ගුණාංග පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

(ලකුණු 06යි)

(4) මෙහි දැක්වෙන පරිදි ප්‍රභාවතීන්ට මුහුණ දීමට සිදුවන සෝචනීය ඉරණම හමුවේ කුසරජු ප්‍රේමාන්විත ස්වාමිපුරුෂයකුගේ ස්වරූපය හෙළි කෙරෙන නිදසුන් දෙකක් පැහැදිලි කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

(ලකුණු 06යි)

නැතහොත්

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නගියි උදේ
රන්තරු රිදී තරු හවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල්ගස් මුදුනෙ වැදේ

ගෙන එයි මිහිරි ගී මඳනල හමන විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට
උදයට පෙනේ බොල් පිති බිඳු පබලු ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතකම ඇති උණුසුම් ගතිය මත
උගතිමි කිම්ද මිනිසා සතු දෙනෙත තෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නොව උණු වී හැළෙන ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි ගෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනෙකු විසින්
ඒවා කඩා බිඳ ගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයක දි එකට හමුවන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමු වේවා දකුණ

(1) කවියා කම්පනයට පත්ව ඇත්තේ කුමන හේතුවක් නිසා ද?

..........................................................................................................................................................

..........................................................................................................................................................

(ලකුණු 04යි)

(2) කවියා යොදා ගෙන ඇති කාව්‍යෝක්ති දෙකක් දක්වන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

(ලකුණු 04යි)

(3) ''බැඳ ඇති පවුරු පදනම්'' යනුවෙන් කවියා හඳුනාගන්නේ මොනවාදැයි පැහැදිලි කරන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

(ලකුණු 06යි)

(4) මෙම පද්‍ය පන්තියෙහි කාලීන වැදගත්කම පහදන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

(ලකුණු 06යි)

## II කොටස

**සැලකිය යුතුයි :**

- පළමු ප්‍රශ්නය ද 2 , 3 , 4 , 5 ප්‍රශ්නවලින් ප්‍රශ්න දෙකක් ද ඇතුළුව ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.
- ☛☛ පත්‍රයට අදාළ පිළිතුරු සපයා වෙන ම භාර දෙන්න.

(1) පහත දී ඇති පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොටගෙන **රසාස්වාදයක්** ලියන්න. පිළිතුර වචන 200ක්වත් තිබිය යුතුය.

හිස නමා ගති ඈ
සිහින් රතැඟිලි පටලවා ගති
සතියකට පෙර ගෙනා වර
විළිබරය මගෙ රන්වන් මනාලිය

දැල්තිර අස්සෙන්
පෙනෙයි ඈ
ඔබ යනු මොබ එනු
පට පිළී ගෙන අබරණ පෙට්ටි ගෙන
ඇසෙයි නොපෙනෙ විටත්
සාලයෙන් කාමරයට
කාමරයෙන් සාලයට
යන පා හඬ
මා වෙත එතත් ඈ
වුවමනාවක් කිසිත් නැතිව ද
නො රැදෙයි පලායෙයි
ගෑ විලවුනෙහි
නැත, රන්වන් සමෙනි
හෙළන සුස්මෙහි සුවඳය ඒ
ඈ බඳ සුවඳ
දැනෙන්නේ මට විතර ද?

පෙනෙයි ඈ
ඇසෙයි
දැනෙයි
මට ගේ හැම තැන

(අ) පැදි පෙළට පාදක වූ අත්දැකීම
(ආ) කවියාගේ අත්දැකීමට අදාළ විවිධ අවස්ථා නිරූපණය
(ඉ) පැදි පෙළට තේමා වූ වස්තු බීජයෙහි නව්‍යතාව
(ඊ) පද්‍ය පන්තිය සඳහා යොදාගත් ආකෘතිය
(උ) එම ආකෘතියට යොදාගත් භාෂාවේ උචිත අනුචිත බව (ලකුණු 6×5=30යි)

(02) අධිෂ්ඨානශීලී ව කටයුතු කළහොත් පරමාර්ථ ජයගත හැකි බව කුස රජුගේ චරිතය ඇසුරින් විමසන්න.
(ලකුණු 15යි)

(03) සමාජය සතු සුදන චරිත ඉස්මතු කිරීමත් දුදන චරිත බැහැර කිරීමත් සුභාෂිතය පද්‍ය ඇසුරින් විමසන්න.
(ලකුණු 15යි)

(04) සාහිත්‍යකරුවා සැබෑ ලෝකය දකින්නේ අප දකින ආකාරයට නොවේ. අපූර්වත්වයෙන් යුතුව ය. ජනකවි ඇසුරින් පහදන්න. (ලකුණු 15යි)

(05) මහගමසේකරයන්ගේ තුංමංහන්දිය නවකතාවෙහි භාෂාව ගලා යාමට සලස්වන්නේ අවස්ථා නිරූපණය වන අන්දමට මෙන් ම කතා රසය තීව්‍ර වන අන්දමට ය. නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 15යි)